ජනමාධ්‍යවේදියෙකු විසින් ලියනා ලිපියක් තුළ අඩංගු වන කරුණු සම්බන්ධයෙන් පැහැදිලි මූලාශ්‍ර සහ පැහැදිලි පදනමක් තිබීම අනිවාර්‍ය කරුණක් වන්නේ, එසේ නොමැති නම් එම ලිපියේ සඳහන් කරුණු කෙතරම් දුරට විශ්වාස කළ හැකිද, නිවැරදිද යන ගැටළුව මතුවන බැවිනි. යම් ලිපියක් තුළ ජනමාධ්‍යවේදියා විසින් තමන්ගේ අදහස් ඇතුළත් කළද, එම අදහස් සඳහා පවා මනා පදනමක් තිබිය යුතු බව මෙහිදී කීමට හැක.

එසේ නොවන අවස්ථාවක් සඳහා උදාහරණයක් ලෙසින් අරුණ පුවත්පතේ සඳහන් වන මෙම ලිපියේ ඇතැම් කොටස් පෙන්වා දිය හැක. මෙහිදී මාධ්‍යවේදියා විසින් දක්වන මතයන් කිහිපයක්ම තිබේ. එනමුත් එම මතයන් පළ කරන්නේ කුමන පදනමකින්ද යන්න සම්බන්ධයෙන් කිසිදු අදහසක් ඒ තුළ ගැබ් නොවේ. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, "අම්මලා ලිබරේෂන් චින්තනයට ගොදුරු වීම නිසා ලංකාවේ දරුවන් ලක්ෂ සංඛ්‍යාවක් අසරණ වී සිටිති" යනුවෙන් පවසන්නේ කුමන සංඛ්‍යාලේඛනයන් හෝ දත්ත පදනම් කරගනිමින්ද?

එසේම තමන් විසින් සමාජගත කරනා අදහස් කෙතරම් ඉදිරිගාමීද නැතිනම් පසුගාමීද යන කරුණ සම්බන්ධයෙන්ද ජනමාධ්‍යවේදියෙකු අත විශාල වගකීමක් තිබේ. සනීපාරක්ෂක තුවා සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වේදිකාවක කථා කිරීමෙන්, සිංහල බෞද්ධ සාරධර්මයක් වන කාන්තාවන්ගේ ලැජ්ජා බිය නැතිකර දැමෙන්නේ යැයි කීම නිශ්චිත පදනමකින් තොර, අතිශයින්ම පසුගාමී අදහසක් නොවන්නේද? එවැනි අදහසක් සමාජගත කරනා ජනමාධ්‍යවේදියා විසින් තමන අත ඇති සමාජ වගකීම නොසලකා හැර ඇතැයි ඔබ නොසිතන්නේද?

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#mediaethicsSL #SinhalaPress #lka #SathiAgaAruna